# වරකාපොල ප්‍රාදේශීය සභාව

## 2025 වර්ෂය සඳහා මස් කඩ , කඩ කාමර හා පොදු වැසිකිළි, බදු දීම සඳහා වන ලංසු කැඳවීමයි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මඟින් පැවරී ඇති බලතල අනුව වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් උප ලේඛන අංක 01හි සඳහන් මස් කඩ,මාළු කඩ, කඩ කාමර, පොදු වැසිකිළි 2025.01.01 දින සිට 2025.12.31 දක්වා (දෙවන වර) බදු දීම පිණිස මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් 2024.10.29 දින පෙ.ව 10.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

02.**ටෙන්ඩර් ආකෘති පත්‍ර 2024.10.15 දින සිට 2024.10.28 දින දක්වා පෙ.ව 8.30 සිට ප.ව 3.00 දක්වා නිකුත් කරනු ලැබේ.**ඒ සඳහා කරනු ලබන ගෙවීම් මුදලින් පමණක් කල යුතු අතර තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල යුතුය.

03.නියමිත ගාස්තු ගෙවා ලබා ගනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍ර අයදුම්පත් දෙකකින් යුතුව සම්පූර්ණ කොට මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන වෙනම තමන් මිළදී ගැනීමට අපේක්ෂිත බදු දේපළේ නම ලිපි කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ අනිවාර්යෙන් සඳහන් කර ලියුම් කවර 02 ක බහා මුද්‍රා තබා 2024.10.29 වන දින පෙ.ව 10.00 ට පෙර අතින් ගෙනවිත් භාර දීම හෝ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතු අතර ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04.**ටෙන්ඩර් විවෘත කිරීම 2024.10.29** වන දින **පෙ.ව.10.15** ට සිදු කෙරේ.ඒ සඳහා ලංසු ඉදිරිපත් කරන අයට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

05.මේ පිළිබඳ වැඩි විස්තර කාර්යාල වෙලාවන්හිදී ලබාගත හැක. දුරකථන අංකය : 035-2267275

**ලේකම් හා බලතල , කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,**
**වරකාපොල ප්‍රාදේශීය සභාව.**

### උපලේඛනය 1

**වරකාපොල සතිපොල භූමියේ මස් කඩ**

| අනු අංකය | බදු දේපළේ නම | ආකෘති පත්‍ර ගාස්තුව (රුපියල්) | ආපසු ගෙවන ටෙන්ඩර් ඇප තැම්පත් මුදල (රුපියල්) | අවම ලංසුව (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | කඩ කාමර අංක 01 එළු මස් කඩය | 1500.00 | 2000.00 | 205200.00 |

**කඩ කාමර**

| අනු අංකය | බදු දේපළේ නම | ආකෘති පත්‍ර ගාස්තුව (රුපියල්) | ආපසු ගෙවන ටෙන්ඩර් ඇප තැම්පත් මුදල (රුපියල්) | අවම ලංසුව (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | නෙළුන්දෙණිය ආයුර්වේද ගොඩනැගිල්ලේ බිම් මහලේ කඩ කාමර අංක 01 | 1500.00 | 972.00 | 97200.00 |
| 02 | නෙළුන්දෙණිය ආයුර්වේද ගොඩනැගිල්ලේ බිම් මහලේ කඩ කාමර අංක 02 | 1500.00 | 918.00 | 91800.00 |

**පොදු වැසිකිළි**

| අනු අංකය | බදු දේපළේ නම | ආකෘති පත්‍ර ගාස්තුව (රුපියල්) | ආපසු ගෙවන ටෙන්ඩර් ඇප තැම්පත් මුදල (රුපියල්) | අවම ලංසුව (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | නෙළුන්දෙණිය පොදු වැසිකිළිය | 1500.00 | 486.00 | 48600.00 |
| 02 | වරකාපොල හෙළ බොජුන්හල අසල පොදු පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය නැමති පොදු වැසිකිළිය | 1500.00 | 1566.00 | 156600.00 |